සැ. යු.- (i) 2013.06.21 දින පළ වූ අංක 1816 දරන *ගැසට් පත්‍රයේ* I-III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,817 - 2013 ජූනි මස 28 වැනි සිකුරාදා - 2013.06.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1610 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1617 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 1617 |


සැ. යු.- (i) කේ. ඩී. එම්. චන්ද්‍රා බණ්ඩාර ප්‍රජා සත්කාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(ii) අකුරණ ජාමිආ රහ්මානියා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(iii) මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු — ඇබෑර්තු

## මධ්‍යම පළාත් සභාවේ කඩුගන්නාව නගර සභාවේ ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කඩුගන්නාව නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවාගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති මහනුවර දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013.05.21, 2011.12.23 සහ 2009.07.29 දින අනුමත කරන ලද මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික මට්ටමේ ශිල්පීය, අර්ධ ශිල්පීය, ශිල්පීය නොවන සේවක ගණයට අයත් සේවා ව්‍යවස්ථාවන්ට අනුව අදාල පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම.

| *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *සේවක ගණය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 1. රියදුරු | III | ප්‍රාථමික ශිල්පීය | 01 | රා.ප.ච. අංක06/2006 IV - PL 03<br>රු. 12,470 -10 x 130 - 10 x 145 - 10 x160 -12 x170 - රු 18,860 | 01. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.<br><br>*වෘත්තීය හා වෙනත් සුදුසුකම් :-*<br><br>01. බඳවා ගන්නා දිනට වසර 03කට පෙර (අවම වශයෙන්) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ මෝටර් රථ බලපත්‍රය.<br><br>02. වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුවේ.)<br><br>03. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. |
| 2. ආදාහනාගාර ක්‍රියාකරු | III | ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | රා.ප.ච. අංක06/2006 IV - PL02<br>රු. 12,210 -10 x 130 - 10 x145 - 10 x160 12 x170 - රු. 18,600 | 01. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම.<br><br>02. තාක්ෂණ හැකියාව පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම විශේෂ සුදුසුකමක් සේ සැළකේ. |
| 3. මුරකරු | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | රා.ප.ච. අංක06/2006 IV - PL01<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. |

| තනතුරු නාමය | ශ්‍රේණිය | සේවක ගණය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 4. ආදාහනාගාර ක්‍රියාකරු සහායක | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | රා.ප.ච. අංක06/2006 IV - PL01 රු. 11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථයලබා තිබීම. |
| 5. වැඩ/ක්ෂේත්‍ර කම්කරු | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 05 | රා.ප.ච. අංක06/2006 IV - PL01 රු. 11,730 - 10 x 120 - 10 x 130- 10 x 145 - 12 x 160 - රු. 17,600 | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්විය යුතුය. |
| 6. සෞඛ්‍ය කම්කරු | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | රා.ප.ච. අංක06/2006 IV - PL01 රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160 - රු. 17,600 | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්විය යුතුය. |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

I. රියදුරු තනතුර සඳහා වන අයදුම්කරුවන් හැර අනෙකුත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

II. රියදුරු තනතුරු සඳහා ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරෙන් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

II. එසේම රාජ්‍ය සේවා පත් කිරීම් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

III. තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුල වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්ත්වයක නොමැති වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

IV. දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන් පමණක් එක් අවුරුදු පරීක්ෂණ කාලයකට යටත් වේ.

04. *වෙනත් පොදු කොන්දේසි :-*

I. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩිය විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

II. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

III. විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

V. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට මහනුවර දිස්ත්‍රික්කය තුල අඛණ්ඩව යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.

VI. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

VII. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුල වරදකට (අවවාද කිරීම් හැර) දඬුවමක් ලබා නැත්තාවූ ද, මෙම කාලය තුල යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තාවූ ද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තව දුරටත් දායක විය යුතුය.

VIII. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, මධ්‍යම පළාත් සභාව හෝ කඩුගන්නාව නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

05. *අයදුම්කළ යුතු ආකාරය* :-

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2013 ජූලි මස 29 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, කඩුගන්නාව නගර සභාව, කඩුගන්නාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය. (දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.) අයදුම්පත් ඒ 4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම භාවිතා කළ යුතු ය.) අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතු ය.);
(v) සේවා සහතික (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි).;

07. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම, සංශෝධනය කිරීම ආදී සියළු බලතල කඩුගන්නාව නගර සභාවේ ලේකම් සතු ය.

ඩබ්ලිව්. ජී. සෙනෙවිරත්න බණ්ඩාර,
වැ. බ. ලේකම්,
කඩුගන්නාව නගර සභාව,
කඩුගන්නාව.

2013 ජූනි මස 10 වැනි දින,
කඩුගන්නාව නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම***

***කඩුගන්නාව නගර සභාව***

................................................................. *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :————.
මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
02. ස්ථිර ලිපිනය:————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————.
04. ජාතික හැඳුනුම්පත් අංකය:————.
05. උපන් දිනය : අවුරුද්ද:————., මාසය :————., දිනය:————.
06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————.මාස:————. දින:————.
07. ස්ත්‍රී/පුරුෂභාවය:————.
08. විවාහක/අවිවාහක බව:————.
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද ? යන වග :-
10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි):
අ.පො.ස. (සා.පෙළ) විභාගය
සමත් වර්ෂය:————. විභාග අංකය:————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | 5.<br>6.<br>7.<br>8. | |

11. (i) වෙනත් අධ්‍යාපන සුදුසුකම්:————.
(ii) වෘත්තීය සුදුසුකම්:————.
(iii) සේවා පළපුරුද්ද:————.

12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :———.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග :———.
එම තනතුරට පත්වූ දිනය :———.
13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :———.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති ඉහත තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම භාර ගනු ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය:———.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ........................................ මහතා/මිය/මෙනවිය මෙම ආයතනයේ ........................................................ කු වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

———.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:———.
තනතුර :———.
ආයතනය :———.
දිනය :———.

06-740

---

සංශෝධනයයි

**මදුරාවල ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

මදුරාවල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා 2013 මැයි මස 03 වැනි සිකුරාදා දිනැති අංක 1809 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(ආ) වැනි කොටස — පළාත් පාලනය යටතේ අංක 1120 පිටුවේ පළකරන ලද පුරප්පාඩු පිරවීමේ නිවේදනයේ අංක 01 යටතේ බඳවා ගැනීම පහත අයුරින් සංශෝධනය කරමි.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ 11 පංතිය කාර්යාල කාර්ය සහායක | 02 | PL1- -2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160 - රු. 17,600<br>(ආරම්භය 13,060 12 පියවර) | අ.පොස. (සා.පෙළ) විභාගයේ දී, එක් වරක දී කවර හෝ විෂයයන් 06ක් සමත්වී තිබීම. |

2013.05.03 වැනි දින ගැසට් නිවේදනයේ අනෙකුත් කොන්දේසි එලෙසින් ම වලංගු වන අතර, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2013.07.12 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

සඳසීලි කාරියවසම්,
ලේකම්,
මදුරාවල ප්‍රාදේශීය සභාව,
මදුරාවල - අඟුරුවාතොට.

2013 ජූනි මස 10 වැනි දින,
මදුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

06-748

## කළුතර නගර සභාව

කළුතර නගර සභාවේ පහත සඳහන් පුරප්පාඩු වෙනුවෙන් මෙම නිවේදනයේ පරිදි සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනට මෙම සභාවේ සේවයේ නියුතු ආදේශක සහ කොන්ත්‍රාත් අය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|
| 1 | සෞඛ්‍ය කම්කරු III | 13 | රු.11,730 - 10 x 120- 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 ආරම්භක වැටුප් පියවර (රා. ප. ච. 6/2006 iv අනුව PL1 - 2006A) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් |
| 2. | ක්‍රීඩා භූමි භාරකරු III | 1 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 - රු.17,600 ආරම්භක වැටුප් පියවර (රා.ප.ච. 6/2006 iv අනුව PL1- 2006A) | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය 9 වසර සමත්වීම. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| 3. | යන්ත්‍ර ක්‍රියාකරු II (බැකෝ ලෝඩර්) | 1 | රු.12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860. ආරම්භක වැටුප් පියවර (රා.ප.ච. 6/2006 iv අනුව PL1 - 2006A) | 1. අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය 9 වසර සමත්වීම (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා)<br>2. අ.පො.ස. (සා. පෙ.) විභාගයේදී කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම (බාහිර අයදුම්කරුවන් සඳහා) පළමුව අභ්‍යන්තර සේවකයින් අතුරින් පුරප්පාඩු පුරවනු ලබන අතර, එසේ සුදුසුකම් නොමැති නම් බාහිර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.<br>*වෘත්තීය හා වෙනත් සුදුසුකම් :*<br>(i) තාරබර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් රථ හා බර ට්‍රේලර් හා මගීන් 32 ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාව පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br>(ii) අවම උස අඩි 5 අඟල් 6 විය යුතු ය.<br>(iii) බඳවා ගැනීමට යෝජිත තනතුරට අදාළ බර යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳ රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීණතාවක් ලබා තිබීම.<br>(පිළිගත් ආයතනය වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක්, පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.)<br>(iv) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතු ය. | වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|
| 4. | පුස්තකාල සහායක II | 1 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු.17,600 (රා.ප.ච. 6/2006 iv අනුව PL1- 2006A) ආරම්භක පියවර රු. 13,060 | අ.පො.ස. (සා. පෙ.)විභාගයේ දී එක්වරක දී කවර හෝ විෂයයන් 06 ක් සමත්වීම. (අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා) මාර්ග හා සෞඛ්‍ය කම්කරුවන් 08 වැනි ශ්‍රේණිය හෝ 9 වසර සමත්ව තිබිය යුතුය. (පළමුව අභ්‍යන්තර සේවකයින් අතුරින් පුරප්පාඩු පුරවනු ලබන අතර එසේ සුදුසුකම් නොමැති නම් බාහිර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ. | සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| 5. | මුරකරු II | 04 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (රා.ප.ච. 6/2006 iv අනුව PL1-2006A) ආරම්භක පියවර රු. 13,060 | (i) අ.පො.ස (සා. පෙ.) විභාගයේ දී එක්වරක දී කවර හෝ විෂයන් 06 ක් සමත්වීම. (අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා)<br>(ii) මාර්ග හා සෞඛ්‍ය කම්කරුවන් 08 වැනි ශ්‍රේණිය හෝ 9 වසර සමත් තිබිය යුතු ය.<br>(පළමුව අභ්‍යන්තර සේවකයින් අතුරින් පුරප්පාඩු පුරවනු ලබන අතර, එසේ සුදුසුකම් නොමැති නම් බාහිර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.) | සම්මුඛ පරීකෂණයක් මගින් |
| 6. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III | 16 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 ආරම්භක වැටුප් පියවර (රා.ප.ච. 6/2006 iv අනුව PL1-2006A) | 05 වන ශ්‍රේණිය/ 06 වසර සමත්වීම. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීම. |

02. *බඳවා ගැනීම සඳහා කොන්දේසි :-*

01. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
02. අයදුම්පත් භාර ගන්නා දිනට පූර්ව ආසන්න වසර තුනක (03) කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපායි.
04. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීරික සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතු ය.
05. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
06. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවක දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනයවීම් සහ ව්‍යවස්ථා ආදේශ කිරීමට යටත්ව මෙම නිවේදනය කරනු ලැබේ.

03. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, පහත සඳහන් ලියවිලි අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්;
(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය;
(v) පළපුරුද්ද පිළිබඳ සහතික.

04. මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කරන ලද අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2013.07.15 දිනට පෙර "ලේකම්, කළුතර නගර සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ ඉල්ලුම්කරන තනතුරු සඳහා අයදුම්පත් යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ. යු. - මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ කල් දැමීම හෝ අවලංගු කිරීමේ සියළු බලතල කළුතර නගර සභාවේ ලේකම් සතුවේ.

නෙලු නිශාන්ති ඉද්දගොඩ,
ලේකම්,
කළුතර නගර සභාව.

2013 ජුනි මස 09 වැනි දින.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළුතර නගර සභාවේ තනතුර ........................................ සඳහා බඳවා ගැනීම*

01. මුලකුරු සමග නම :————.
මුලකුරුවලින් හැඳින්වෙන නම්:————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————.
03. ස්ථිර ලිපිනය:————.
04. ජාතික හැඳුනුම්පත් අංකය:————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය:————.
06. උපන් දිනය:————.
2013.07.15 දිනට වයස ඃ-
අවු:————. මාස:————. දින:————.
07. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචි වීමෙන් ද? :————.
08. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) ඃ
(i) සමත් වූ ඉහළම වසර/ශ්‍රේණිය:————.
(ii) අ.පො.ස. (සා.පෙළ) විභාගය :
විභාග අංකය:————.
විභාග වර්ෂය හා මාසය :————.
සමත් වූ විෂයයන් :

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |

(iii) අ.පො.ස. (උ. පෙළ)
විභාග අංකය:————.
විභාග වර්ෂය හා මාසය:————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |

09. විවාහක/අවිවාහක බව:————.
10. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලබා තිබේ ද?:————.
11. අධ්‍යාපන සුදුසුකම්:————.
12. ඔබ දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම් එම සේවා කාලය හා විස්තර:————.
13. පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්:————.

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතු ය.)

මෙම ඉල්ලුම්කරු වන.................. මයා./මිය. දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.......................... වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු වේතනාධික සියල්ල උපයාගෙන ඇත. ඔහු මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවත් පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කරන බව ද/නොකරන බව ද ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද සහතික කරමි.

———,
දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ප්‍රධානියාගේ
හෝ බලය පවරනු ලබන නිලධාරියාගේ අත්සන.

නම :———.
පදවි නාමය:———.
දිනය:———.
දෙපාර්තමේන්තුව/ආයතනය:———.

06-739

## පළාත් පාලන නිවේදන

### මතුගම ප්‍රාදේශීය සභාව

2007 අංක 01 දරන බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තියේ 20 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව 1560/6 2008 ජූලි 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (*අති විශෙෂ*) ගැසට් පත්‍රයේ (අ) වැනි කොටසේ පළකරන ලද බස්නාහිර පළාත් අංක 01 දරන නාගරික ඝන ද්‍රව්‍ය කළමනාකරණ රීති මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මකව ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන වැළඳ ගැනීම සුදුසු බව 2013 අප්‍රේල් 11 වැනි දින පැවති මහ සභාවේ දී යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ. තව ද මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දිනයේ සිට එකී රීති මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මකව ක්‍රියාත්මක වන බව වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

2013 මැයි මස 30 වන දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

එල්. ජී. ලියනආරච්චි,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

06-832

## විවිධ දැන්වීම්

### දික්වැල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122, 126 (IX)ආ වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වැනි වගන්තිය යටතේ ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 02 වැනි වගන්තිය යටතේ ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව සකස් කරන ලද අංක 520/07 දරන 1988.09.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සටහන් අතුරු ව්‍යවස්ථා 2008.09.23 වැනි දින දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මහ සභාව විසින් පිළිගෙන ඇති එහි සඳහන් 09 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ එකතු කරනු ලබන ප්‍රදේශයන්හි පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් ගාස්තුවක් අයකිරීමට යෝජනා කරන ලදී.

*කසල ගාස්තු අය කිරීම :*

| | | |
|---|---|---|
| | | *රු. ශත* |
| 1. | කසල ලීටර් 06 සිට 15 දක්වා බැහැර කරනු ලබන ආයතනයක් සඳහා එක් දිනකට | 50 0 |
| 2. | කසල ලීටර් 15 සිට 30 දක්වා බැහැර කරනු ලබන ආයතනයක් සඳහා එක් දිනකට | 100 0 |
| 3. | කසල ලීටර් 30ට වඩා බැහැර කරනු ලබන ආයතනයක් සඳහා එක් දිනකට | 200 0 |
| 4. | *සුන්බුන් බැහැර කරනු ලබන සියළු නිවාස ආයතන සඳහා පහත සඳහන් ගාස්තු :* | |
| | සුන්බුන් ඝන අඩි 18.75 ක් සඳහා (ටේලර් 1/4) | 200 0 |
| | සුන්බුන් ඝන අඩි 37.5ක් සඳහා (ටේලර් 1/2) | 300 0 |
| | සුන්බුන් ඝන අඩි 37.5ක් සඳහා (ටේලර් 3/4) | 400 0 |
| | සුන්බුන් ඝන අඩි 75ක් සඳහා (ටේලර් 1) | 600 0 |

කසළ එක්රැස් කිරීමේ නව ප්‍රදේශවල එක් නිවසකින් දුර අනුව අවම ගාස්තුව රු. 100.00 ට හා උපරිම ගාස්තුව රු. 150.00 ට යටත්ව ගාස්තු අය කෙරේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

06-575

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.